# පන්හිඳයි පින්සලයි



සිසිර දිසානායක

"මොකද? පැහිච්ච ඉසකෙයා ගලවනවද?"

මූණ බලන කණ්ණාඩිය ඉහ වටේට කරකව කරකවා ලොකු කණ්ණාඩිය ඉස්සරහා ඇඹරෙන පින්සල දැකලා පන්හිඳට හිනා.

"ඔව් ඉතින් පැහිච්ච ඉසෙකෙයා හරි තියෙන්න එපායැ ගලවන්න."

පින් ඔලොක්කුවට වගේ පන් ට කිව්වා. පන්ට ඉබේට ම තමුන්ගේ තට්ටෙට අත ගියා.

පැන්සලත් ඒ කතාවට ඇහැරිලා. තුන් දෙනාම සිකුරාදට නිදා ගත්තේ සෙනසුරාදා පාන්දර වෙලා. පන්, පින්, පැන් තුන්දෙනා එක්ක එකට ඉගෙනගත්තු පන්ති මිත්‍රයෙක් ලංකාවෙ ඉඳන් ඇවිත්. සිකුරාදා රාත්තිරියම පන්ති මිත්‍ර සංසදයේ තවත් එක එකමුතු වක් වුණා.

"අමරෙව දැක්කෙ අවුරුදු හතළිහකට විතර පස්සෙ."

"ඉස්කෝලෙන් අස්වුණාට පස්සේ මුණගැහුණාමයි, ඔය..."

ලංකාවෙ ඉඳන් ආව පන්ති මිත්තරයාගේ නම රත්නපාල. "අමරෙ" කියන්නෙ යාළුවෝ විහිළුවට කෙටියට හදා ගත්ත නමක්.

"ඒ දවස් වල අමරෙගේ වැඩේම ඉතින් අමරදේවතුමාවයි එතුමගෙ සින්දුයි නැති කරපු එකනේ."

රත්නපාල නිතරම අමරදේවතුමාගේ සින්දු කියන්න උත්සාහ කළා.

"අමරදේවතුමාලා දෙන්නෙක් ඉන්න බෑනේ. අපි රත්නෙට "අමරෙ" කියල කියමු. ඒ දවස්වල පන්ති මිත්තරයෝ යෝජනා කළා මතකයි."

"අනික අමරදේවතුමා ගායනා කරපු සින්දු රත්නෙ කියන්න දඟලනවා විතරයි නේ. ඒ හන්දා අමරෙ කිව්වම හොඳටම ඇති." ඔය විදියටයි ඒ අන්වර්ථ නම පන්ති මිත්තරයෝ අතරේ ලියා පදිංචි වුණේ.

"අමරෙට වෙච්ච සංගදියම තමා අපටත් වුණේ.... " ඒ පන්හිඳ.

"මොන මොනවා හරි කුරුටු ග ගා උන්නු හන්දා පන්ට "පන්හිඳ" කියලා නම වැටු ණා. ඇඳපු හින්දා පින්ට "පින්සලයා" කියලා වැටුණා. ගණං ඉලක්කං හන්දා පැන්ට "පැන්සලයා" කියලා නම වැටුණා... "

"මොනවා උනත් වැදගත් නම් තුනක්. නරක ඒවා නෙවෙයි හොඳ වෙලාවට."
"දැන් ඉතින් අවුරුදු හතළිහකටත් වැඩි කාලයක් තිස්සේ අපි ඔය නම් එක්ක තමයි ඉතින්..."

"ඇත්තටම හතළිහක් කියන්නේ මනුස්ස ජීවිතයක බාගයක් විතරනේ, අද කාලේ හැටියට?"

"අවුරුදු හතළිහකට කලින් අපි කොහොමද උන්නේ?"

"ඇයි ඉතින් දැන් මක් වෙලා ද?"

"නෑ ඉතින් ඒ කාලේ කරපුවා දැන් කරන්න බෑනේ...."

"බැරිමත් නෑ හිත තරුණ නම්..."

"පන්ට පුළුවන් ලියන්න. පින්ට පුළුවන් අඳින්න.... පැන් මිම්ණුවා..."

"ඇයි ඉතින් පැන්ට බැරිද ඉලක්කම් සෙල්ලම?"

"බැරිම නෑ. ඒත් ඒ කාලේ වගේ ලේසි නෑනේ..."

"එහෙම බැළුවොත් ලියන අඳින ඒවා වල වුණත් එදා තිබුණ ඒ ජවය නැතිව ඇති."

පින්සල පන්තියේ බිත්ති පුවත්පතට චිත්‍ර ඇන්දම පන්හිඳ ඒවට ගැලපෙන්න කවි ලිව්වා. පැන්සල ගණං ඉළක්කං අතේ ගිහින් පන්තියේ පළවෙනියා වුණා. අන්තිම පේළියේ උන්නු පන් පින් දෙන්නගෙ ඩෙස්වලයි, සටහන් පොත්වලයි කුරුටු ගීතයි, බලි රූපයි පිරෙද්දි පැන් විභාගවලින් පැන ගත්තේ ඉස්සරහා පේළියේ ඉඳගෙනමයි. ඒත් දැන් තුන්දෙනා ම මෙල්බන්වල චමරියක එකට. ඒකෙත් හැටි ඇත්තටම.



ඉස්කෝලෙ යන කාලේ "හොම්රන් පැස්" පාට කූරු වලින් ඇඳපු චිත්‍රයක් පින්සල "සන්නස" පත්තරේට යවන්න සූදානම් කළා.

ඇත්තටම තරුණ කාලේ ගැන තියෙන්නේ සතුටක් මට නං.... " පැන් කිව්වා.

"අපටත්..." අනික් දෙන්නත් එකඟයි. "අපි කරන්න ඕන දේවල් කළා. කාට වත් බයේ හැංගෙන්නේ නැතුව, හිතට එකඟව ඒ දේවල් කළා. ඒ සතුටයි මේ තියෙන්නේ."

"ඒ සතුට නිසා ලැබුණ හයිය හැමදාමත් අපට තියෙනවා. ඒ නිසා හිතින් අපි හැමදාමත් තරුණයි කියලා තමයි හිතෙන්නේ."

"සඳ හිරු තරු පවතින තුරු අපි මැ රෙන්නේ නෑ..."

කේ.ඩී.කේ ධර්මවර්ධන මහත්තයා ලියලා වික්ටර් රත්නායක මහත්තයා ගයපු ගීයක පන්හිඳ කියන්න උත්සාහ කළා.